ඉවතලන තේ රොඩුවලින් කඩදාසි හදන ශ්‍රී ලාංකික තරුණයකුගේ කතාව

අප මෙතෙක් දන්නේ කඩදාසි හදන්නේ පිදුරුවලින් බවය. එහෙත්, අහක දමන තේ රොඩුවලින් කඩදාසි තැනූ ශ්‍රී ලාංකීය තරුණයෙකු ගැනයි මේ කතාව.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන විශ්ව විද්‍යාලවලට අමතරව, මෑතකදී පිහිටුවනු ලැබූ වයඹ විශ්ව විද්‍යාලයේ වැවිලි කළමණාකරණ විශේෂවේදී උපාධියක් හදාරණ ඔහු හර්ෂ අබේවර්ධනය. ඔහු ඒ සඳහා දූත් ප්‍රේටන්ට් බලපත්‍රයක ද ලබාගෙන සිටී.

හර්ෂ අබේවර්ධනට තේ රොඩුවලින් කඩදාසි සෑදීමේ කල්පනාව ඔලුවට වැටුණේ විශ්ව විද්‍යාලයේ ව්‍යාපෘතියක් කරන්නට යාමේදීය.

වැවිලි කළමනාකරණ විශේෂවේදී උපාධියක් හදාරන ඔහුට, විශ්ව විද්‍යාලයේ ව්‍යාපෘතිය සඳහා තේ කර්මාන්තශාලා ගණනාවකට ම යන්නට සිදුවිය. ඒ කර්මාන්තශාලාවල පසෙක කඳු මෙන් ගොඩගැසී ඇති ඉවතලන තේ රොඩු ඔහු දුටුවේය. 'Refused Tea' ලෙස හඳුන්වන මේ තේ රොඩු තනිකර ම කුණු කන්දල් ගොඩකි. කිසිම ප්‍රයෝජනයක් නැති මේවා කර්මාන්තශාලාවලට හිසරදයක් වී ඇති අයුරු හර්ෂ දුටුවේය. එක් අතකින් මේ 'තේ රොඩු කඳු' නිසා කර්මාන්තශාලා පරිශ්‍රයේ ඉඩ ඇහිරෙයි. අනික් අතට මෙවැනි කුණු කන්දක් සමඟ තේ කර්මාන්තශාලාවට ලැබෙන ප්‍රමිති සහතිකය ලබා ගැනීම අමාරුය.

'මං කල්පනා කළා මේ ඉවතලන තේ කුඩුවලින් මොකක් හරි ප්‍රයෝජනවත් වැඩක් කරන්න බැරි ද කියලා. එතකොට මට නිකමට වගේ හිතුණා, අත් කඩදාසි වගේ දෙයක් හදන්න පුළුවන් නේද කියලා...' හර්ෂ කියයි.

ඔහුගේ ඒ වෑයමට කෘෂිකර්ම හා වැවිලි කළමණාකරණ පීඨයේ උපාධිය හදාරා අවසන් කළ චමිල ප්‍රගීත් කුමාර ද එක් විය. විශ්ව විද්‍යාලයේ ගුරු භවතුන්ගෙ සහය ද හර්ෂටත්, චමිලටත්, නොඅඩුව ලැබිණි. වෙහෙසකර ව්‍යායාමයකින් පසුව ඔවුහු තේ රොඩුවලින් කඩදාසි සටන ජයගත්හ.

තේ රොඩුවලින් අත්කඩදාසි සෑදීමේ ක්‍රියාදාමය අපූරු එකකි. මෙහිදී ඔවුහු පල්ප් වර්ග 2ක් පාවිච්චි කරති. ඉන් එකක් ප්‍රතිචක්‍රීයකරණය කරන ලද කඩදාසි පල්පයි. අනෙක කෙසෙල් ගසේ ව්‍යාජ කඳේ මදයෙන් ලබාගත් කොටස් අඹරා සෑදූ පල්පයයි.

මේ පල්ප් වර්ග දෙකට ඉවතලන තේ රොඩු එක් කළ විට කඩදාසි වර්ග දෙකක් ලැබෙන බව හර්ෂ කියයි. ඒ සමඟ ම තේ රොඩු එක් එක් අනුපාතයෙන් මිශ්‍ර කළ විට ද විවධ ස්වභාවයේ කඩදාසි ලබා ගැනීමට පුළුවන් වෙයි.

'දැන් ලෝකයේ ම පරිසර හිතකාමී නිෂ්පාදනවලට ඉහළ ඉල්ලුමක් තිබෙනවා. ඒ හින්ද අපි හදපු මේ අත් කඩදාසිවලට මේ රටේ වගේම පිටරටත් හොඳ ඉල්ලුමක් තියෙනවා. පිදුරුවලින් කඩදාසි හදනකොට අවි 3 x 2 අත් කඩදාසියක් හදන්න රුපියල් 35ක් විතර වියදම් වෙනවා. ඒත් තේ රොඩුවලින් හදන ඒ ප්‍රමාණයේ කඩදාසියකට යන්නේ රුපියල් 30ක් වගේ මුදලක්. ඊට වඩා වියදම අඩු වනවා මිසක් වැඩි වෙන්නේ නම් නෑ...'

තේ රොඩුවලින් අත්කඩදාසි සෑදීමේ ක්‍රියාදාමය අපූරු එකකි. මෙහිදී ඔවුහු පල්ප් වර්ග 2ක් පාවිච්චි කරති. ඉන් එකක් ප්‍රතිචක්‍රීයකරණය කරන ලද කඩදාසි පල්පයි. අනෙක කෙසෙල් ගසේ ව්‍යාජ කඳේ මදයෙන් ලබාගත් කොටස් අඹරා සෑදූ පල්පයයි. මේ පල්ප් වර්ග දෙකට ඉවතලන තේ රොඩු එක් කළ විට කඩදාසි වර්ග දෙකක් ලැබෙන බව හර්ෂ කියයි. ඒ සමඟ ම තේ රොඩු එක් එක් අනුපාතයෙන් මිශ්‍ර කළ විට ද විවධ ස්වභාවයේ කඩදාසි ලබාගැනීමට පුළුවන් වෙයි.

හර්ෂ සිය නිර්මාණය ගැන ජයග්‍රාහී ලීලාවෙන් කතා කරයි.

ඉවතලන තේ කුඩු සම්පීඩනය කර සෑදූ ගඩොලක්

හර්ෂ සහ චමිල විසින් නිපදවනු ලැබූ මේ අත්කඩදාසිවලින් බොහෝ නිෂ්පාදන කළ හැකිය. සුබ පැතුම්පත්, ලියන කඩදාසි, සැරසුම් කඩදාසි (decorative papers) මෙන්ම තේ ඇසිරීම සඳහා අලංකාර ඇසුරුම් පෙට්ටි ද මේ මඟින් නිපදවිය හැකිය. ඒ සඳහා මෙරට තුළ ම විශාල ඉල්ලුමක් තිබෙන බව හර්ෂ කියයි.

තේ රොඩුවලින් අත්කඩදාසි සමඟ තවත් නිෂ්පාදනයක් ද එළියට පැමිණියේය. හර්ෂ ඒ නිෂ්පාදනය හඳුන්වන්නේ 'තේ රොඩු ගඩොල්' හෙවත් refused tea bricks නමිනි. මෙහි දී ඔවුන් කළේ ඉවතලන තේ සම්පීඩන ක්‍රියාවලියකට ලක් කර ගඩොල් ආකාරයේ කුට්ටි සෑදීමය.

'එහෙම කළා ම ඒවා පිටරට යවන්න ලේසියි. ජපානය වගේ රටවල්වල කාබනික පොහොර හදන්න ඉවතලන තේ කුඩු ගන්නවා. ඉවතලන තේ රට යවනකොට මේ වගේ ගඩොල් හදලා යැව්වොත්, ඇසුරුම් පරිමාව අඩු කරගන්න පුළුවන්. අපි හදපු මේ 'තේ කුට්ටි' විදියට රට යවනකොට කන්ටේනර් 10කින් යවන ඉවතලන තේ කුඩු, එක කන්ටේනර් එකකින් යවන්න පුළුවන් වෙනවා.'

කොහොම නමුත් මේ නිෂ්පාදන දෙකට ම ප්‍රේටන්ට් බලපත් ලබාගත් පසුව ව්‍යාපාරයක් වශයෙන් එය දියුණු කිරීම තමන්ගෙසිහිනය බව හර්ෂ කියයි.

කදාන ද මැසනද් විද්‍යාලයයේ ආදි සිසුවකු වූ හර්ෂ, තවමත් ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයේ අවසන් වසරේය. චමිල ප්‍රගීත් කුමාර වැවිලි කළමනාකරණ උපාධිය හදාරා අවසන් කර ඇත. උපාධිය ලබාගෙන තැනින් තැන රැකියා සොයමින් ඇවිදින තරුණ තරුණියන්ට හිතේ වීරියෙන් නැගිටින මේ තරුණයන් දෙදෙනා හොඳ ආදර්ශයකි.

'අපට මේ වැඩේට හුඟක් දෙනෙක් සහයෝගය දුන්නා. වයඹ විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ පීඨාධිපති මහාචාර්ය එස්.ජේ.බී ජයසේකර, වැවිලි කළමණාකරණ පීඨයේ මහාචාර්ය එන්.ඊ.එම් ජයසේකර, තලවකැලේ ප්ලාන්ටේෂන් ලිමිටඩ්හි සමරසෙට් වතු අධිකාරී සේනක අලවත්තේගම, සම්පත් සංවර්ධන කළමණාකරු හිරාන් ජයසුන්දර වගේම එලිවිල කඩදාසි සමාගමේ කළමණාකරු නිහාල් අමරතුංග ඒ අය අතරින් සුවිශේෂයි'

හර්ෂට නැගී සිටින්නට උදව් කළ සෑම කෘතවේදීව සිහිපත් කරයි.

'අපේ මේ නව නිපැයුම සාර්ථක කරගන්න වයඹ විශ්ව විද්‍යාලයේන් සැහෙන සහයෝගයක් අපට ලැබුණා. ඇත්තටම, මේක පිටිපස්සේ ඉන්නේ වයඹ විශ්ව විද්‍යාලය කිව්වත් නිවැරදියි. මං ඉතාම කෘතවේදීව ඒක සිහිපත් කරනවා...'

හර්ෂ ඉතා නිහතමානීව අප හා කීවේය. ඔවුන්ගේ මේ වෑයම දිරිමත් කරන්නට ඔස්ට්‍රේලියාවේ ජීවත්වන අයටද අවස්ථාව තිබේ. ඒ සඳහා කැමති අයකු වෙත් නම් පහත සඳහන් ලිපිනයෙන් සහ දුරකථන අංකයෙන් වැඩි විස්තර ලබාගත හැකිය.

හර්ෂ අබේවර්ධන,
නො 31,
නවලෝකගම,
රාගම.
දුරකථනය +94 77 606 3988


ඉවතලන තේ කුඩු 25% ක් යෙදූ කඩදාසිය


ඉවතලන තේ කුඩු 40% ක් යෙදූ කඩදාසිය


ඉවතලන තේ කුඩු 60% ක් යෙදූ කඩදාසිය


ඉවතලන තේ කුඩු 95% ක් යෙදූ කඩදාසිය